<u>රත්නපුර ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 20 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 03 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව වෙළඳ බලපත්‍ර ආදායම රු. 437,450 ක් වියයුතු වුවත්, රු. 649,700 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම රු. 212,250 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2014 අප්‍රේල් සිට අගෝස්තු දක්වා ආයතනයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම වූ රු. 4,457,555 ක මුදලින්, රු. 236,095 ක් ණයහිමි වටිනාකමට හිලව් කර ශුද්ධ ප්‍රමාණය වූ රු. 4,221,460 ක් පමණක් ප්‍රේෂණය කර තිබුණද, එයට අදාල ගැලපීම් ලෙජර් ගිණුම් මඟින් හෙලිදරව් කර නොතිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ)(I) රු. 1,568,628 ක් වටිනාකමැති වත්කම් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඉවත් කිරීමට හා වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ නමුත් එම ක්‍රියාවලිය සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබූ නමුත් ජ'නල් සටහන් අංක 09 යටතේ මෙකී වටිනාකම වත්කම් ගිණුම් වලින් ඉවත් කර ගිණුම්ගත කර තිබුණි.

(II) රු. 35,830 ක්වූ මිලදී නොගත් වත්කම් වටිනාකම සහ රු. 1,700 ක්වූ සුළු උපකරණ තොගයක් ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම් තැබීමෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් ශේෂය රු. 37,530 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ)(I) සමාලෝචිත වර්ෂයේදී ගෙවීමට නොහැකි වූ රු. 746,741 ක් වටිනාකමැති වියදම් ණයහිමියන් යටතේ ගිණුම්ගත කල යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීමෙන් වර්ෂයේ වියදම හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 7,446,484 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

වෙළඳ බලපත්‍ර ලෙජර් ගිණුමට අනුව රු. 193,730 ක හිඟ ශේෂයක් දක්වා තිබූ නමුත් එවැනි ශේෂයක් පිළිබඳව ලේඛණ මඟින් හෝ එම වටිනාකම සෑදුනු ආකාරය පිළිබඳව හෝ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි 371(2) | යම් කාර්යයක් වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් එම කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවද, ලබා දී තිබූ රු.946,989 ක්වූ අත්තිකාරම් දිගින් දිගටම නොපියවූ අත්තිකාරම් ලෙස පැවතුණි. |
| (II) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල මාස 06 ක් ඉක්මවූ එකතුව රු. 79,145 ක් වූ චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි 570 සහ 571 | යොමුගත රෙගුලාසි ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු නියාදනය කල යුතු වුවත්, තැන්පත් වටිනාකම රු. 3,283,572 ක්වූ තැන්පතු ශේෂ 45 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 41/90 චක්‍රලේඛයේ 3.13 වගන්තිය | අළුත්වැඩියාවට ඉදිරිපත් කරන ලද වාහනයේ මිල ගණන් වල සාධාරණත්වය සම්බන්ධයෙන් සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගත යුතු වුවද සභාවේ JCB යන්ත්‍රයේ හා අංක WP PF 5494 දරණ කැබ් රථයේ රු. 265,395 ක් හා රු.357,370 ක අළුත්වැඩියා කිරීම් සඳහා එසේ ඉංජිනේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | පළාත් පාලන කොමසාරිස් ලිපි අංක සීජ්පී/211/30 හා 2009 නොවැම්බර් 23 දිනැති ලිපිය | පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා ඔවුන්ගේ ධූර කාලයට පමණක් සීමා වනසේ පෞද්ගලික ලේකම්වරයෙක් බඳවා ගැනීමේදී සලකා බැලිය යුතු අධ්‍යාපන සුදුසුකම් පිළිබඳවත්, මාසයකට අඩු කාලයක් සේවය කර ඇති අවස්ථා වලදී දීමනා ගණනය කිරීමට යොදා ගන්නා සමානුපාතික දින ගණන පිළිබඳවත් සලකා බැලිය යුතු වුවත්, බඳවා ගත් පෞද්ගලික ලේකම්ගේ අධ්‍යාපනික සුදුසුකම් හෝ සේවය කර ඇති දින ගණන පිළිබඳව හෝ සලකා බැලීමකින් තොරව 2015 වර්ෂයේ රු.101,640 ක දීමනා ගෙවීමක් කර තිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 7,479,511 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 18,820,702 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 11,341,191 කින් අඩුවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 60 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වල සියයට 66 ක අඩුවීම හා වැටුප් හා දීමනා, ගමන් වියදම්, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා සහ ප්‍රවාහන සම්බන්ධතා වල පිළිවෙලින් සියයට 40, සියයට 30, සියයට 15 හා සියයට 11 ක වැඩිවීමකි.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 224 | 39 | 81 |
| බදු කුලී | 701 | 258 | - |
| බලපත්‍ර ගාස්තු | 712 | 708 | 194 |
| වෙනත් ආදායම් | 30,764 | 32,520 | 22,716 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බදුකුලී, සේවා සඳහා ගාස්තු සහ වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයන්හි රැස්කල ආදායම, අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 85, සියයට 63, සියයට 32, හා සියයට 23 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

---------------

වරිපනම් බදු අයකර ගතහැකි දියුණු ගම් ප්‍රදේශ ගණනාවක් සභා බල ප්‍රදේශය අතර එකී ගම්මාන දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකර ගැනීමේ හැකියාව පැවතියද, යෝජිත වරිපනම් ප්‍රදේශ සිතියම්ගත කිරීමෙන් ඔබ්බට වූ ඉදිරි පියවර නොගැනීම හේතුවෙන් වර්ධනය කරගත හැකි ප්‍රධාන ආදායම් ප්‍රභවයක් වර්ධනය කර ගැනීම දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බල ප්‍රදේශය තුල පිහිටා ඇති බදු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 ඔක්තෝබර් 09 දින වනවිට වෙළඳ බලපත්‍ර ලබා ගැනීමේ හිඟහිටි අවස්ථා 346 ක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) හිඟ අක්කර බදු ලෙස බදුකරුවන් 139 දෙනෙකු ගෙන් රු. 27,006 ක් ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් වලින් විගණිත මූල්‍ය ප්‍රකාශනයට අනුව වාර්ෂික ආදායමින් 1% ක් බදුලෙස සභාව වෙත අයකර ගත හැකි වුවත්, සභා සීමාව තුල පිහිටි සංචාරක හෝටල් වලින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉහත බදු මුදල් අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු වලට අදාලව සහ බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකථන හා සන්නිවේදන කුළුණු වලට අදාලව සවිස්තරාත්මක ලේඛණ නඩත්තු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රමාණවත් ආදායමක් අය කර ගැනීඹට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභා බල ප්‍රදේශය තුල ත්‍රීරෝද රථ නැවතුම්පලවල් රාශියක් පැවතියද, එකී නැවතුම්පල වල පහසුකම් වැඩිකර නීත්‍යානුකූලව ස්ථාපිත කර වාර්ෂිකව හෝ මාසිකව ත්‍රීරෝද රථ වලින් ගාස්තුවක් අයකර ගැනීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 සැප්තැම්බර් මස සිට 2015 දෙසැම්බර් මස දක්වා මුද්දර ගාස්තු උපලේඛණ ගෙන්වා ගෙන නොතිබූ අතර, එම මුදල් අයකර ගැනීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස සිට දෙසැම්බර් මස දක්වා උසාවි දඩ උපලේඛණ ගෙන්වා ගෙන නොතිබූ අතර, එම මුදල් අයකර ගැනීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවයේ නියුතුව සිටි කාර්යය මණ්ඩල සාමාජිකයින් වෙත නිදහස් කිරීමට ඇති රු. 11,049 ක්වූ සේවක ඇප යම් බැඳීමක් වේනම් ඒවා නිරවුල් කිරීමෙන් අනතුරුව නිදහස් කල යුතු වුවත්, එසේ කටයුතු නොකර දිගින් දිගටම සභාව වෙත රඳවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභාව සතු සුසාන භූමි 70 ක් තිබුණද, ඒවායේ මැනුම් කටයුතු සිදුකර සභාව වෙත විධිමත් පරිදි පවරා ලේඛණගත කර සීමා මායිම් ලකුණු කර ආරක්ෂා කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වීථි ලාම්පු හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු. 335,950 ක් ගෙවීම් කර තිබුණි. එකී වීථි පහන් සවිකිරීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් හඳුනාගැනීමට නොහැකි විය. අවශ්‍යතාවය පිළිබඳ හඳුනා ගැනීම සඳහා ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුනොකිරීම, තාක්ෂණික නිලධාරියාගේ පූර්ව නිර්දේශයකින් තොරව මිලදී ගැනීම, ලැබීම් හා නිකුත් කිරීම් සඳහා ලේඛණයක් නිසි පරිදි නඩත්තු නොකිරීම සභාව විසින් නිකුත් කරන ලද වීථි පහන් හඳුනා ගැනීම සඳහා සවි කරනු ලබන වීථි පහන් වලට විධිමත් අංකන ක්‍රමයක් නොතිබීම යනාදි පරිපාලන දුර්වලතා දක්නට විය . එලෙසම ගලවා ඉවත් කරන ලද නැවත අළුත්වැඩියා කර භාවිතයට ගතහැකි වීථි පහන් ගබඩාවට භාර දීම හා භාර ගැනීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

--------------------

(අ) සභාපතිවරයාගේ රාජකාරී සඳහා භාවිතා කර තිබූ ලියාපදිංචි අංක WP PF 5494 දරණ කැබ් රථය ධූර කාලය අවසන් වී තිබූ 2015 ජූලි මස 31 දින හෝ එදිනට පෙර විධිමත් පරිදි ආපසු සභාව වෙත පවරා ගතයුතුය. එලෙස ආපසු භාරදීමෙන් තොරව 2015 අගෝස්තු 10 වන දින දක්වා හිටපු සභාපතිවරයා දිගින් දිගටම තම පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගෙන තිබූ අතර මෙකී කාල සීමාව තුල කිලෝමීටර් 497 ක් ධාවනය කර තිබුණි. වාහනය නැවත සභාව වෙත පවරා ගන්නා අවස්ථාවේදී අනතුරකට පත්ව අළුත්වැඩියා කිරීම සිදුකර ඇති බවත්, ඒ සඳහා රු. 265,395 ක් ගෙවා තිබූ බවත් එකී අනතුර පිළිබඳව හෝ මෙකී කැබ් රථයේ අළුත්වැඩියාව පිළිබඳව හෝ කිසිදු තොරතුරක් සභාව සතුව නොමැති බව විගණනයේදී අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය යෝජනා යටතේ ප්‍රදේශයේ දිළිඳු ජනතාවට බෙදා දීම සඳහා රු. 277,600 ක් වටිනාකමැති සෙවිලි තහඩු සහ රු. 156,500 ක් වටිනාකමැති ප්ලාස්ටික් පුටු 200 ක් මිලදී ගෙන තිබුණි. එකී භාණ්ඩ බෙදා දුන් ආයතන හෝ පුද්ගලයින් අතර එම භාණ්ඩ ලබා දීමේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබූ බවද එම භාණ්ඩ බෙදා හැරීමෙන් පසු අදාල කාර්යය වෙනුවෙන් එකී භාණ්ඩ යොදාගත් බවට නිසි පසුවිපරමක්ද සභාව විසින් සිදුකර නොතිබූ බවද පුටු මිලදී ගැනීම සම්බන්ධයෙන් විධිමත් මිල කැඳවීමක් සිදු කරන ලද බවටද පැහැදිලි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) මීහිටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම - II අදියර සඳහා සභා අරමුදල් යටතේ රු. 1,500,000 ක වැඩ ඇස්තමේන්තුවක් මත දිගින් අඩි 900 ක්, පළල අඩි 08 ක් හා මාර්ගයේ ඝනකම අඟල් 05 ක් වනසේ

කොන්ක්‍රීට් කිරීම සඳහා 2015 මැයි 05 දින මාස 03 ක ගිවිසුම් කාලයක් සඳහා රු. 1,483,843 ක ගිවිසුමකට එළඹ තිබුණි. විගණන පරීක්ෂණ දිනය වූ 2015 ඔක්තෝබර් 16 දින වනවිට වැඩ නිමකර කොන්ත්‍රාත්කරුට රු. 1,449,142 ක් ගෙවීම් කර තිබුණි.

වැඩ බිම අධීක්ෂණය කල කාර්මික නිලධාරී ඉදිකිරීම් ඉහත පරීක්ෂණ දින ස්ථාන 06 කින් මාර්ගය පළුදු කර පරීක්ෂා කිරීමේදී මාර්ගයේ එම ස්ථාන වල ඝනකම පිළිවෙලින් 3¼", 4½", 2¾", 2¾", 2¾", 4¾" ක් විය. ඒ අනුව මාර්ගයේ සාමාන්‍ය ඝනකම අඟල් 3.45 ක් විය. ඒ අනුව ඉටු නොකල කොන්ක්‍රීට් වැඩ සඳහා රු. 406,720 ක් ගෙවීම් කර තිබූ අතර, ඉටු කළ වැඩ කොටසද නියමිත ප්‍රමිතියෙන් නොවූ බව නිරීක්ෂණය විය. පළුදු කර පරීක්ෂා කල කිසිම ස්ථානයක ABC මිශ්‍රණය පෙන්වීමට කාර්මික නිලධාරී අපොහොසත් විය. ඒ අනුව ඒ සඳහා දරණ ලද රු. 61,180 ක මුදලද ඇතුළුව ඉටු නොකල වැඩ සඳහා රු. 467,900 ක් ගෙවා තිබුණි.

මේ අනුව මෙම කර්මාන්තය වෙනුවෙන් සභා අරමුදලින් දරණ ලද රු. 1,449,492 ක්වූ වියදම නිශ්කාර්යය වියදමක් බවත්, නියමිත ප්‍රමිතියෙන් තොරව සිදු කරන ලද කර්මාන්තයක් බවත්, විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සබරගමුව පළාත් සභාවේ ප්‍රතිපාදන මත සභාව විසින් ක්‍රියාත්මක කල රු. 4,051,407 ක් වටිනාකමැති කර්මාන්ත 15 කට අදාලව කොන්ත්‍රාත්කරුවන්ට 2005, 2006, 2014 හා 2015 යන වර්ෂ වල ගෙවීම් සිදු කිරීමේදී එම බිල්පත් පළාත් සභාව අනුමත කිරීමටත් පෙර සභා අරමුදලින් ගෙවීම් සිදුකර එය අත්තිකාරම් ගෙවීමක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව කර්මාන්ත 07 කට අදාලව ගෙවා තිබූ අත්තිකාරම් මුදල් වූ රු. 1,066,815 ක් පළාත් සභාව විසින් ප්‍රතිපූර්ණය නොකිරීම මත විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 08 දින වනවිටද එකී අත්තිකාරම් මුදල් පියවීමට නොහැකිව තිබුණි.

## 04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 4.1 අයවැය පාලනය.

-------------------

වැය විෂයයන් 55 කට අදාලව රු. 5,282,246 මුළු ප්‍රතිපාදන කිසිදු කාර්යයක නොයොදා තිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය